# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/02/08/2021-ll | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.03.26 |
|---|---|---|---|---|---|

**ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ : 2017/14ට දෙවන එකතුව.**

සියළුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්
බැංකු සමිති /සමෘද්ධි බැංකු කළමණාකරුවන්

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ට ණය ලබාදීම සඳහා බැංකු සමිති වෙත ලබාදෙන ප්‍රතිමූල්‍ය ණය (පණ) වැඩසටහන.</u>**

1. සමෘද්ධි ප්රජාමූල බැංකු සමිති විසින්,“දිවිනැගුම ඉසුර” ණය වැඩසටහන යටතේ,ණය ප්‍රදානය කිරීමට, බැංකු සමිතිය සතු අරමුදල් නොමැති විටක,මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 29හි ඡේද අංක 14 හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2017/14ට පළමු එකතුවේ සඳහන් පරිදි, ප්‍රජාමූල බැංකු අංශයෙන් ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කල හැක.

2. දිවිනැගුම ඉසුරු ණය වැඩසටහන යටතේ,ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ඉල්ලීම් කිරීමේදී, බැංකු සමිතිය විසින් පහත සුදුසුකම් සහ නිර්ණායක සම්පූර්ණ කළ යුතුය.

    I. දිවි නැගුම ඉසුර ණය වැඩසටහන යටතේ, කල්පසුවූ සහ බොල්ණය අනුපාතය උපරිම 5% විය යුතුය. (ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කරන දිනට අදාල මසට පෙර, මාසය තුල)

    II. දිවිනැගුම චක්‍රලේඛ අංක 2014/07ට පළමු එකතුවෙහි ඡේද අංක 12හි පරිදි, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කරන ණය ව්‍යාපෘතිය /ව්‍යාපෘතීන් වලට අදාල ශක්‍යතාවය පරීක්ෂා කර ලබාදුන් අනුමැතිය . (අනුමැතියලත් ලිපියෙහි පිටපතක් ඉදිරිපත් කල යුතුය)

    III. ණය මුදල සඳහා ණයකරු විසින් රක්ෂණ ආවරණයක් ලබා ගෙන තිබීම. (සහතික කල පිටපතක් ඇමිණිය යුතුය).

    IV. ආසන්න තම පසුගිය වර්ෂයේ, බැංකු සමිතිය මෙහෙයුම් ලාභයක් උපයා තිබීම.

    V. සමෘද්ධි බැංකු සමිතියේ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දරණ ලද වියදම් සඳහා වෙන් කිරීමේ ගිණුම හි (කේත අංක 9404) ශේෂයට සමාන ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කිරීම.

    VI. ප්‍රජාමූල බැංකු අංශයෙන් දැනට ලබාගත් ප්‍රතිමූල්‍ය ණය මුදල් පැහැර හැර නොතිබීම.

    VII. සම්පූර්ණ කර එවිය යුතු ලිපි ලේඛන සියල්ල ඉදිරිපත් කර තිබීම.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

3. ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කිරීමේදී අනෙකුත් ලිපි සමඟ ඇමුණුම 01හිආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතුය.

4. ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ සංශෝධනයන් මෙපමණ වන අතර, අනෙකුත් උපදෙස් සඳහා ප්‍රතිමූල්‍ය ණය සහ දිවිනැගුම ඉසුර ණය වැඩසටහන යටතේ ලබාදුන් උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතු බව දන්වමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස. සහ අ.ක.ස.
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.